# සොබාවට සොබාවක් වූ
# සොබා

පුරවරයේ කම්දොරුවේ,
ලිපිගොනු සටහන් අතරේ
දස දහසක් වැඩ මැද්දේ
සසල සිතක් නිසල කළේ
ඔබ ම යැ, සොබා

ඈත වනපෙතේ
තුරු වදුලක සුව සෙවණත්
දිය දහරක මෙත් සිසිලත්
මල් ගොමුවක සිල් සුවඳත්
මවෙත ගෙනාවේ
ඔබ ම යැ, සොබා

ඈත ගම්පෙතේ,
ගැමි ගෙදරක සිරි දසුනත්
කෙත් යායක රන් කරලත්
දෙස් අහරක රස මුසුවක්
මවෙත ගෙනාවේ
ඔබ ම යැ, සොබා

සොබාදම
සොබමන් කළේත්
එය මවෙත ගෙනාවේත්
ඔබ ම යැ, සොබා
ඔබ සොබාවට සොබාවක් මැ විය.

- මයන්ත මුතුකුමාරණ

# වර්ෂාව

මේ මල මේ ලෙස පිපිලා තිබුණා
ලොව ඉකි ගසනා කුරිරු යමේ
මේ හිම කැටි බිම වැටිලා තිබුණා
ලොව ගිනිගන්නා රුදුරු යාමේ

තරුමල් පිබිදෙන කළුවන් අහසින්
දුක්බර කඳුලක් වැටෙන වෙලේ
මිණිකැට විසිරෙන ඔබගේ මුවෙනුයි
මේ පරවු මල පුබුදු කළේ

ලොවට කියන්නේ කාලේ ඇවෑමෙන්
මගෙ රට නිරුදක කතරක් කරන්නෙපා
ඔබ සැමට කියන්නේ මගේ ලක් තුමියට
කඳුලක්  හිමිකරලන්න එපා

ඩබ්ලිව්. ඒ. ඉරුකා සජීවනි
රාජ්‍ය දැව සංස්ථාව
නුවරඑළිය

